සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

දෙවන වාර ඇගයීම2018 -
,உணஷலஹகஷ ஜுடஇண கஜபகஷகப்ல் - 2018
Second Term Evaluation2018 -

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 11 | විෂයය / பாடம் / Subject සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper I | පැය / மணித்தியாலம் / Hours 01 |

නම / பெயர் / Name ------------------------------------------------

සැලකිය යුතුයි

I. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 කි.
II. අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති 1,2,3,4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
III. ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
IV. එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

- අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු** අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වචනය තෝරන්න.

1. බොරු පොරොන්දු දී **ඇඟිල්ලේ නැටවීමට** සමහරු සූරයෝ ය.

   1. සිතැඟි ලෙස හසුරුවා ගැනීමට
   2. බලපෑම් කිරීමට
   3. තර්ජනය කිරීමට
   4. ඉබාගාතේ යැවීමට

2. **පොට වරද්දා ගැනීම** නිසා ප්‍රශ්නය බැරෑරුම් වූ බව ගුරුතුමා පැහැදිලි කළේ ය.

   1. ලුණුවේ අග මුල නොදැනීම
   2. නිවැරදි උත්සාහය
   3. වැරදි පිළිතුරු සැපයීම
   4. වැරදි පියවරක් ගැනීම

3. **වැලේ වැල් නැතිව සිටි** තමාට දැන් හොඳ කාලයක් උදා වී ඇති බව එතුමා සිය කතාවේ දී කීවේ ය.

   1. මහත් දුෂ්කරතා සහිත ව
   2. එල්ලීමට ආධාරකයක් නැති ව
   3. ආර්ථික අමාරුකම් ඇති ව
   4. විශාල මුදල් කන්දරාවක් නැති ව

- අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.

4. සුනාමි ව්‍යසනයෙන් පසුව ඉක්මනට ම යථා තත්ත්වයට පත් වීමට හැකි වූයේ .................. ආපදා අවස්ථා කෙරේ අවධානය යොමු කිරීම නිසා ය.
   1. පශ්චාත්  2. නූතන  3. පෙර දින  4. පසු දා

5. කලා නිර්මාණයකින් අපට ආස්වාදයක් ලැබිය හැක්කේ උචිත හා අදාළ දේ තෝරා ගෙන සිය .................... ඒවා විචිත්‍රවත් ලෙස ඉදිරිපත් කොට ඇති බැවිණි.
   1. ග්‍රහණයෙන්  2. පරිකල්පනයෙන්  3. අත්දැකීමෙන්  4. අනවබෝධයෙන්

6. භාෂාව මාර්ගයෙන් අපේ ....................... පැහැදිලි කොට ගැනීම මෙම වැඩසටහනේ අරමුණ බව ඔහු කිවේ ය.
   1. නිර්මාණ  2. ගෞරවය  3. අනන්‍යතාව  4. අවතක්සේරුව

7. අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.
   1. ඓන්ද්‍රිය , ඓරාවණ , ඓශ්වර්යය , ඓක්‍යය
   2. ජෝතික , ඥප්ති , ඥානවෘද්ද , ඥාපන
   3. අක්‍රම , අක්‍රෝධ , අක්‍රිය , අක්ෂ
   4. කාහල , කකුල , කැවිලි , කිරි
8. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
   1. නිළධාරිනිය , අභිවෘද්ධිය , ගැහැණිය , බේදවාචකය
   2. එළිපෙහෙලි , ආමන්ත්‍රණය , අණ්ඩර දෙමල, දෘශ්‍යාධාර
   3. නිර්දිෂ්ට , ලේඛකාධිකාරී , සැලකිල්ල , සංශෝධනය
   4. බෝධීගරය , පාඨමාළාව , දෘශ්‍ය කාව්‍යය , සණ්ටාර කුලුන

9. එක් එක් වචනවල මුලකුරෙහි ඉස්පිල්ල , පාපිල්ල , ගැට ඇලපිල්ල , දීර්ඝ ඇදය අනුපිළිවෙළින් යෙදී ඇති උත්තරය තෝරන්න.
   1. කාසිය , නුවණ , කෘදන්ත , නාවල
   2. මිහිරි , රුදාව , ක්‍රමය, මූසල
   3. කිරීටය , රැය, දෘෂ්ටිය , රූමත්
   4. සිපිරිගෙය , කුඩය , කෘත්‍රිම , නැඹිලිය

10. 'ගුණ සයුර' යන වචනය අයත් වන්නේ

   1. විභක්ති සමාසයට ය
   2. විශේෂණ සමාසයට ය
   3. අව්‍යය සමාසට ය
   4. දකාරාර්ථ සමාසයට ය

11. 'උත්තල' යන වචනය
   1. නාම පදයකි
   2. උපසර්ග පදයකි
   3. විශේෂණ පදයකි
   4. නිපාතයකි

12. කුඹුරෙන් යන පදයේ ස්වර හා ව්‍යඤ්ජන වෙන් කළ විට ක්+උ+ඹ්+උ+ර්+එ+න් ලෙස සකස් කළ හැකි නම් බිංගෙය යන්නෙහි නිවැරදි වර්ණය වන්නේ,
   1. බ්ං+ග්+එ+ය්+අ
   2. බ්+ඉ+ං+ග්+එ+ය්+අ
   3. බ්+ඉ+න්+ග්+අ+ය්+අ
   4. බ්+ඊ+න්+ග්+එ+ය්+අ

13. 'නටයි' යන පදයේ ධාතු ප්‍රකෘතියත් 'ගසෙන් 'යන්නෙහි නාම ප්‍රකෘතියත් වෙන් කළ විට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.
   1. නටා , ගස්
   2. නට , ගසේ
   3. නට , ගස්
   4. නටමින් , ගස්

14 '
- ඔවුහු <u>විදුහල්පති තුමා වෙත</u> ගියහ.
- *මාගේ මේ ව්‍යායාමය <u>රජ සැප පිණිස</u> නො වේ.*

ඉරි ඇඳි පදවල විභක්ති වන්නේ
   1. කර්ම , සම්ප්‍රදාන
   2. අවධි , සම්බන්ධ
   3. ප්‍රථමා , කර්ම
   4. කරණ , සම්බන්ධ

- අංක 15 සිට 16 තෙක් ප්‍රශ්නවල **තද කළු** අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන උත්තරය තෝරන්න.

15. සිංහලයන්ගේ භාෂාව ශ්‍රේෂ්ඨ වූ සුලලිත **සුඛනම්‍ය** සුමධුර භාෂාවකි.
   1. ඉතා සියුම් වූ
   2. හොඳින් නැමෙනසුලු
   3. ඉතා ප්‍රීතිමත් වූ
   4. සියුම් නාමයක් ඇති

16. පෙර බමුණෝ **උදක පාරිශුද්ධිය** නිසා බ්‍රහ්ම සහව්‍යතාවට පත් වන බව විශ්වාස කළහ.

1. ජලයෙන් පිරිසිදු වීම 2. සිතේ පිරිසිදු බව 3. තපස් රැකීම
4. නිතර ම පිරිසිදු ව සිටීම

17. නිපාතයක් යොදා නො ගෙන වස්තුවක් සතු ලක්ෂණ තවත් වස්තුවකට ආරෝපණය කර දැක්වීම,

1. උපමාව යි 2. අතිශයෝක්තිය යි 3. එළිසමය යි 4. රූපකය යි

18. වේග ඇත්තේ , සාධනය කළ යුතු , දිග ස්වභාවය , නිහඬ බව යන එක් එක් අදහස සඳහා තද්ධිත පද පිළිවෙළින් ගැළපූ විට නිවැරදි වරණය සහිත පිළිතුර තෝරන්න.

1. වේගීය , සාධනීය , දිගා , නිහඬතා 2. වේගවත් , සාධන , දිගතා , නිහඬමත්
3. වේගවත් , සාධනීය , දිගටි , නිහැඬියා 4. වේගමත්, සධනීය , දිගැටි , නිහැඬියා

19. අතීත රජවරුන් විසින් දහස් ගණන් මිනිසුන් යොදා ගෙන මහ වැව් සාදන ලද්දේ ය. යන වාක්‍යයේ උක්තය වන්නේ,

1. අතීත රජවරුන් 2. මහ වැව් 3. මිනිසුන් 4. සාදන

20. එක් එක් පද පේළිවල දී ඇති පද යුගලවල සමානාර්ථවත් පද යුගලයක් ඇතුළත් **නො වන** පද පේළිය තෝරන්න.

1. රොස් - කෝප , ප්‍රජාව - ජනතාව , පරිචය - හුරුව , තොස - සතුට
2. පුඤ්ජය - කලබ , ලඹ දෙන - එල්ලෙන ,නිලීන - අප්‍රකට , ආනන්දය - සතුට
3. කලදෝ - රිදී , සුපුන් - මනා සේ පිරුණු , ප්‍රහීන - දුරු වූ , පරිපාකය - මේරීම
4. අනවරත - නිතර , අදාන්ත - නොහික්මුණු , ගම්‍යමාන - හැඟෙන , නිසර්ග -උනන්දු

21. විරුද්ධාර්ථවත් පද යුගලයක් **නො වන්නේ** මෙයින් කුමක් ද?

1. ආවෘත - අනාවෘත 2. නින්දනීය - සම්භාවනීය
3. ප්‍රසිද්ධ - විශද 4. සංක්ෂිප්ත - විස්තෘත

22. “අඳුරට බිය <u>වෙයන්</u> පුතේ''
''තදේ කැසිත් <u>කැස</u> කැසපට අකලා''
''රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙළ <u>දිදී</u> විදුලිය පබා''
''වැහි පොද මගෙ හිමිගෙ හිස මත <u>නො වැටේවා''</u>

ඉහත ඉරි ඇඳි පදවල ක්‍රියා වර්ගය වන්නේ,

1. විධි ක්‍රියා , පූර්ව ක්‍රියා , මිශ්‍ර ක්‍රියා , ආශිර්වාද ක්‍රියා
2. විධි ක්‍රියා , පූර්ව ක්‍රියා , අසම්භාව්‍ය ක්‍රියා , ආශිර්වාද ක්‍රියා
3. ආශිර්වාද ක්‍රියා , මිශ්‍ර ක්‍රියා , පූර්ව ක්‍රියා , විධි ක්‍රියා
4. විධි ක්‍රියා , අසම්භාව්‍ය ක්‍රියා , පූර්ව ක්‍රියා , මිශ්‍ර ක්‍රියා

23. වැරදි අදහස දෙන වාක්‍යය තෝරන්න.

1. සකර්මක වාක්‍ය පමණක් කර්ම කාරක වාක්‍ය රටාවෙන් ලිවිය හැකි අතර අකර්මක වාක්‍ය එසේ ලිවිය නොහැකි ය.
2. ඍ , ර් , ෂ් යන මූර්ධජ අකුරුවලට පර ව යෙදෙන්නේ මූර්ධජ ණ'' කාරය යි.
3. සඳැස් කාව්‍යයක විරිතක් දක්නට ලැබෙන අතර නිසඳැසක දක්නට ලැබෙන්නේ පද සංඝටනාව අනුව ජනනය වන ලයකි.
4. ඓ, ඖ , ඎ යන අක්ෂර සංයුක්ත ස්වර හෙවත් මිශ්‍ර ස්වර ලෙස හැඳින්වේ.

24. ස්වරාදේශ සන්ධියට උදාහරණයක් වන්නේ කුමක් ද?

1.සාහිත්‍යෝත්සවය 2. මිණිබරණ 3. ගිනියම් 4. ළිං පඩිය

25. දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන නිවැරදි ග්‍රන්ථ නාමය ඇතුළත් වරණය තෝරන්න.

1. මුතවදාවිදෙය 2. දාසිදරිළත 3. සපපූවංයට 4. ලනිකුණුකලවිම්මර

- අංක 26 , 27 යටතේ දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

26. නිවැරදි දේ නො කොට නිෂ්ඵල අනුවණ ක්‍රියාවල යෙදීම.

1. තැළෙන යකඩේ දැක්කා ම ආචාරියත් උඩ පැන පැන තළනවා ලු
2. දැළි පිහියෙන් කරවල කපනවා වගේ
3. අතීසාරෙට අමුඩෙ ගහන්නා වගේ
4. ඇඟිල්ල දාන්න දුන්න ම ඔළුවත් දා ගන්නවා වගේ

27. ආර්ථිකයෙන් කොතරම් පිරිහුණත් ලොවට ලොකුකම් පෙන්වීම.

1. කඩිරුළ මැද්දට උණු අළු දැම්මා වගේ
2. ගඟෙන් වතුර බීලා මුහුදට ආ වඩන්නා වගේ
3. බල්ලොත් එක්ක ලැග්ගොත් මැක්කොත් එක්ක නැගිටින්න වෙනවා ලු
4. කන්ඩ නැති ව ඉදගෙනත් බල්ලන්ට හැට්ට මහනවා වගේ

28. A බෝ - ෆිකුස් රෙලිජියෝසා

B පංච+ඵන්ද්‍රිය

C එම්බා චපලකම - නුඹේ නම ගැහැනියයි - හැම්ලට් නාටකය

D මහාප්‍රාණ අක්ෂර තාලුජ ' ශ ' මූර්ධජ ' ෂ ' රකාර සංයෝග රහිත වාග් විලාසය - ලංකා ලංකා පෙම්බර ලංකා ගීතය

A'' B'' C'' D යෙදුම් අතුරෙන් නිවැරදි වන්නේ''

1. A හා B පමණි 2. A හා C පමණි 3. A , C හා D පමණි 4. B , C හා D පමණි

- අංක 29 , 30 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

29. 1. ගොවියෝ හෝ කම්කරුවෝ රට සංවර්ධනය කිරීමට මහත් වෙහෙසක් දරති.
2. මහාචාර්ය සරච්චන්ද්‍ර ශ්‍රේෂ්ඨ නාට්‍ය රචකයෙකු වෙයි.
3. ධර්මපාල තුමා අමද්‍යප ව්‍යාපාරයේ පුරෝගාමියෙකු ලු.
4. ශිෂ්‍යයෝ කැටුව ගුරුවරු සභා ගැබට පිවිසෙති.

30. 1. ඔහු කෙදිනක හෝ දක්ෂ ක්‍රීඩකයෙක් වෙති' යි අපි සැක කළෙමු.
2. වර්තමානයේ බොහෝ ආයතනවල නායක තනතුරුවල කාන්තාවන් ද ඇත.
3. අසරණයෝ නිසරු බිම් ප්‍රදේශවලට පිටමං කරනු ඇත.
4. අපි කිසි දිනෙක ඔවුන් හා තරහා නොවීමු.

31. A වාක් චිත්‍ර ......... සංකල්ප රූපයට ම යෙදෙන පර්යාය පදයකි.
B වෙන මගක් නැත. මෙ මග ........................... යා යුතු වන්නේ ය.
C ඔබ ............................. මේ ගඟ වෙත පැමිණි වාර අනන්ත ය.
D දැනුම .......................... මේ මාහැඟි පුස්තකය ඔබට දෙමි.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?

E පිණිස F යනු G සමග H මෙන්සේ

1. F H E G 2. G E F H 3. F H G E 4. F G H E

32. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැර වූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
සියලු ඥාති මිත්‍ර අය මේ කනගාටුදායක සිද්ධිය පිළිගනිල්ලා.
1. සියලු ඥාති මිත්‍රාදීන් මේ කනගාටුදායක නිවේදනය පිළිගන්න.
2. සියලු ඥාති මිත්‍රාදීහු මේ කනගාටුදායක නිවේදනය පිළිගන්න.
3. සියලු ඥාති මිත්‍රාදීහු මේ කනගාටුදායක නිවේදනය පිළිගනිමු.
4. සියලු ඥාති මිත්‍රාදීන් මේ කනගාටුදායක නිවේදනය පිළිගැනීම මැනවි.

33. පහත සඳහන් ගීත ඛණ්ඩවල පද රචකයින් පිළිවෙළින් යෙදුණ පිළිතුර තෝරන්න.
- “රත්නදීප ජන්ම භූමි...''
- ''වෙර විරිය ඇතත් සිතේ ...
- ''මිහිලිය නළලේ අංජන තිලකේ...
- ''ලංකා ලංකා පෙම්බර ලංකා...

1. මහගමසේකර , මඩවල එස් රත්නායක , සුනිල් ආරියරත්න , අරිසෙන් අහුබුදු ය.
2. අරිසෙන් අහුබුදු , මඩවල එස් රත්නායක , සුනිල් ආරියරත්න , මහගමසේකර ය.
3. මහගමසේකර , සුනිල් ආරියරත්න , මඩවල එස් රත්නායක , අරිසෙන් අහුබුදු ය.
4. සුනිල් ආරියරත්න , මඩවල එස් රත්නායක , මහගමසේකර , අරිසෙන් අහුබුදු ය.

34. උපමාවක් යෙදී **නොමැති** කවි පදය තෝරන්න.
1. දිසි රනලියෙව් රූ සිරි යුත් මෙපුරඟන
2. රිවි බිම්බා යුරු රවි කුල කමලකර
3. නරමුල් ඇඟ ඇට කිඹුලකු වැන්නේ
4. සල සුදු සෙමෙර සේසත් ගිජිඳුනොද වැඩි

35. සමහරු ශ්‍රේෂ්ඨව උපදිති. සමහරු ශ්‍රේෂ්ඨත්වය උදාකර ගනිති. ශ්‍රේෂ්ඨත්වය සමහරුන්ගේ ඇගේ ගසනු ලබයි යන ප්‍රකාශ එන නාට්‍යය වන්නේ
1. ජුලියස් සීසර් ය. 2. ටුවෙල්ත් නයිට් ඕ වට් යූ විල් ය.
3. වැනීසියේ වෙළෙන්දා ය. 4. ඈස් යූ ලයික් ඉට් ය.

36. ඇත ධූලින් වැසී ගිය ඇත් රජ යැ. මැතැ සවණක් ඝන බුදු රසින් සැදී ගිය බුදුරජාණෝ යැ, යන ප්‍රකාශය දක්නට ලැබෙන ග්‍රන්ථය වන්නේ,
1.බුත්සරණ ය 2. අමාවතුර ය 3. පූජාවලි ය 4. සද්ධර්මරත්නාවලිය ය

37. සිලිලාරෙක හෙල්මැලි
පෙති අතරින් සැලි සැලී යන පද්‍යයේ 'හෙල්මැලි' යනු.
1.සීතල ජලය යි. 2. සුදු මානෙල් ය. 3. නෙළුම් ය. 4. ඕලු ය.

38. පොදු වහර වූ 'හිමිදිරිය' යන්න රුහුණු උප භාෂාවේ හඳුන්වා ඇත්තේ කෙසේ ද?
1.කළු කපා එළිය 2. හිනමිදිරිය 3. වයිතාලය 4. ජම්පර කළුව

39. “හැම ගනඳුර බොන වර නිසයුරා ගත
පහන් බැවින් පිටතට සස ලෙසින් වත
පුල් නිලුපුල් සම්වන් කතක වුවනත
කලදෝ කැට තෙලෙක දිසි වැනි පැහැ දිමුත

යන කවියෙන් කියැවෙන්නේ

1. වර්ෂා කාලයක් පිළිබඳව ය. 2. සන්ධ්‍යා කාලයක් පිළිබඳව ය. 3. උදෑසන පිළිබඳව ය .
4. සාගරය පිළිබඳව ය.

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන උත්තරය තෝරන්න.

සංස්කෘතියක් නියෝජනය කරන්නේ , නිරූපණය කරන්නේ , භාෂාව මඟිනි. ඊළඟ පරම්පරාවට සංස්කෘතිය ගෙන යන්නේ භාෂාව මගිනි. ‘භාෂාව හා සංස්කෘතිය අතර ඇත්තේ අවියෝජනීය සම්බන්ධතාවකි’

1. සංස්කෘතියක් පවත්වාගෙන යන්නේ භාෂාව මගිනි. ඒ අතර වෙන් කළ නොහැකි සබඳතාවක් ඇත.
2. භාෂාව මගින් සංස්කෘතිය නිරූපණය කිරීම මෙන් ම පරපුර වෙත ගෙන යාම නිසා ම ඒ දෙක අතර නො වෙනස් සබඳතාවක් පවතී.
3. සංස්කෘතියෙන් භාෂාව ද භාෂාවෙන් සංස්කෘතිය ද හැඩ ගැසෙන අතර නො බිඳිය හැකි සබඳතාවක් ද පවතී.
4. රටක සංස්කෘතිය භාෂාවෙන් පෝෂණය ලබන අතර එය පරපුරෙන් පරපුරට ගෙන යන වාහකය වන්නේ ද භාෂාව යි.

(ල:1×1=40)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

දෙවන වාර ඇගයීම - 2018
,උණ ෂුලහුකෂ ඎ_ඉණ කඎපකෂුකප්ල් - 2018
Second Term Evaluation - 2018

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: II | පැය / மணித்தியாலம் / Hours: 02 |

නම
නකඅඋෂ ..............................................................................................
Name

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 80ක් හිමි වේ.

(i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නො ලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(01) (i) සිංහල අක්ෂර මාලාවේ බැඳි අකුරු ලෙස පෙනුන ද තනි ශබ්ද ලෙස සැලකෙන අක්ෂර දෙක ලියා දක්වන්න.

(අ) .................................................... (ආ) ....................................................

(ii) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

ඔහු විශිෂ්ඨ සාමාර්ථයක් ලැබුවේ අනෙක් ළමයින් මෙන් ජංගම දූරකථනයට වහල් නොවූ නිසා යැයි ගුරුතුමිය කීවා ය.

(අ) .................................................... (ආ) ....................................................

(iii) පහත සඳහන් පද්‍ය පාඨවල ඉරි ඇඳි කොටසේ අර්ථය ලිහිල් බසින් ලියන්න.

(අ) දන පිනන <u>සතර සඟරා වතින්</u>

(ආ) <u>බුජ බල</u> පළ කළ සුරු නර විරු කැල

(iv) පහත දැක්වෙන වාක්‍යයේ ඇතුළත් උපසර්ග පද දෙකක් ලියන්න.

''උත්සව සභාවට වැඩම කරවූ අනුනායක හිමියෝ රටේ සංවර්ධනයට තරුණ ජවය ඇවැසි බව දේශනා කළහ.''

(අ) .................................................... (ආ) ....................................................

(v) පහත සඳහන් පද විසන්ධි කොට ලියන්න.

(අ) කවීකාචාර්ය -

(ආ) උනුන් -

(vi) (අ) 'කන්ද ' යන නාම පදයේ ශබ්ද ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කර දක්වන්න.

(ආ) 'සැරසිලි' යන කෘදන්ත නාමයේ ක්‍රියා මූලය හා කෘදන්ත ප්‍රත්‍යය වෙන් කර දක්වන්න.

(vii) පහත සඳහන් වාක්‍ය සදොස් නම් නිදොස් කොට ලියන්න.

(අ) අපි හෙට දින ශ්‍රමදානයේ යෙදෙනු ඇත.

(ආ) ශිෂ්‍යයෝ පාඩම් කරති'යි ගුරුවරු සිතයි.

(viii) පහත දැක්වෙන වාක්‍යවල ඉරි ඇඳි පදයේ විභක්තිය නම් කරන්න.

(අ) මම <u>පින්සලෙන්</u> සිතුවම වර්ණවත් කළෙමි.

(ආ) පරවුණු මල <u>ගසින්</u> බිමට වැටිණ.

(ix) පහත දැක්වෙන පද කුමන සමාසයකට අයත් වන්නේ දැයි ලියන්න.

(අ) කුකවි -

(ආ) සියපත -

(x) පහත සඳහන් (අ) සහ (ආ) යටතේ දැක්වෙන අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.

(අ) යමක ස්වභාවය එලෙසින් ම කීම -

(ආ) වචනවලින් මැවූ චිත්‍ර -

(2×10 = 20)

(02) පහත දැක්වෙන (අ) (ආ) (ඉ) (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250 කට නො අඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය උත්තර පත්‍රයේ ලියා, රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) පුද්ගලාන්තර සන්නිවේදන කටයුතු සඳහා ප්‍රධාන මෙවලම ලෙස භාවිත වන්නේ භාෂාවයි. සිංහල භාෂාව වූ කලී අන්‍ය භාෂාවකට නො දෙවෙනි පරිපූර්ණ සහ මනෝරම්‍ය වූවකි. දෙස, බස, රැස රැක ගැනීමට අපේ අතීත මුතුන් මිත්තෝ දිවි පරදුවට තැබූහ. එනමුත් වත්මන් ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය මගින් සිංහල බස විකෘති කිරීම, විනාශ කිරීම සුලබ ව දැකිය හැකි ය. මේ පිළිබඳ ව අප සියලු දෙනාගේ අවධානය යොමු විය යුතු වේ.

(ආ) එදා ශ්‍රී ලංකාවේ ජීවත් වූ ජනතාව සමගි සම්පන්න ව, ලජ්ජා බිය ඇතිව, ආගන්තුක සත්කාරයට ලැදි ව ජීවත් වූහ. සියලු ජාතීන් එක මවකගේ දරුවන් මෙන් සුහදශීලී භාවයෙන් ද එකාවන් ව සිටියහ. ඒ බව ලංකාව පිළිබඳ ලියූ විදේශිකයනගේ කෘතිවල ද සඳහන් විය. එදා ශ්‍රී ලංකාවත්, අද ශ්‍රී ලංකාවත් අතර පැහැදිලි වෙනසක් ඇත. යුද ගැටුම්වලින් මිදී ඇති අප විසින් දැන් කළ යුතු දෙය වනුයේ සංහිඳියාව මතින් රට ඉදිරියට රැගෙන යාම යි.

(ඉ) එදිනෙදා තොරතුරු සපයන විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවල ඉස්මතු වන විශේෂාංගය වී ඇත්තේ ප්‍රචණ්ඩත්වය මුසු වූ පුවත් ය. පවුල් ඒකකයේ සිට පුළුල් සමාජය ම වසා පැතිර පවත්නා වූ හොර -මැරකම්, මිනී මැරීම්, දූෂණ වැනි අපරාධ රැල්ලට මත් රකුසා ද එක් ව ගමන් ගන්නා බවක් පෙනේ. මෙවන් දෑ තුළින් සමාජ දේහය ඉරි තැළීමකට බඳුන් වී ඇති අයුරු දැක ගත හැකි වේ. මේ සඳහා නීතියෙන් මෙන් ම පාසලෙන්, පන්සලෙන් ලැබෙන මග පෙන්වීම තව දුරටත් සක්‍රිය විය යුතු බව පෙනේ.

(ඊ) එදා පැල් කවියෙන්, නැළවිලි ගීයෙන් සනසා ගත් ගැමි හදවත අද විද්‍යුත් මාධ්‍ය ඔස්සේ ඇසෙන ශෝකාලාප ගීතයෙන් කම්පිත වේ. සොබා දහම හා බැඳි ගැමි ගීයෙන් සමස්ත පරිසරය ම සානුකම්පිත බවින් පෝෂණය විය. නමුත් නූතන ගීතයෙන් සමාජය කුරිරු බවට අත වනන්නා වැනි යැයි ඇතැම්හු චෝදනා කරති.

(03) පහත දැක්වෙන පාඨය වචන 55- 60 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

රටක අධ්‍යාපන සැලැස්ම ජාතික සැලැස්මක් විය යුතු ය. කාර්යක්ෂම හා ඵලදායි සංවර්ධිත අධ්‍යාපන පද්ධතියක් මගින් විධිමත් ව, නොවිධිමත් ව, මෙන් ම, අවිධිමත් ව ද අධ්‍යාපනය සැපයීම සඳහා මනා සැලසුම්කරණයක අවශ්‍යතාව අන් සියලු අවශ්‍යතාවන් සමග පෙරමුණේ සිටී. ගෝලීයකරණය සමග උද්ගත වී ඇති රටෙහි ආර්ථික, සාමාජික, සංස්කෘතික හා තාක්ෂණික ඉල්ලුමට මුහුණ දිය හැකි පරිදි අධ්‍යාපනයේ ගුණාත්මක භාවය, සමානාත්මතාව හා සහභාගිත්වය වර්ධනය කිරීම සඳහා සැලසුම්කරණ තාක්ෂණය යොදා ගැනීම ඒ සඳහා අත්‍යවශ්‍ය අගනා මෙවලමක් පරිහරණය කිරීමකි.

සමස්ත ලෝකයේ පාසල් පද්ධතිය සුවිශාල එමෙන් ම විප්ලවීය වෙනස්කම්වලට භාජනය වෙමින් පවතී. සමහර විට 21 වන සියවසේ වෙනත් තාක්ෂණික, නොවිධිමත් හා අවිධිමත් අධ්‍යාපන ආයතනවල බලපෑම නිසා පාසල අනවශ්‍ය ආයතනයක් විය හැකි යැ' යි ඇතැම් පුරෝකථනයන් විසින් පෙන්වා දී තිබේ. එහෙයින් අධ්‍යාපන සැලසුම්කරණය පිළිබඳ වගකීම භාරව සිටින ආයතන 21 වන සියවසේ අධ්‍යාපන අභියෝගයන්ට සාර්ථකව මුහුණ දීම සඳහා සූදානම් විය යුතු ය. මේ සඳහා අනාගත දර්ශනයකින් යුක්ත උපායමාර්ගික සැලසුම්කරණය අවශ්‍ය වනු ඇත. ආර්ථිකයේ සිදු වන ශීඝ්‍ර වර්ධනය හා කර්මාන්ත ස්ථානයන්හි දක්නට ලැබෙන පරිවර්තනය, ලෝක වෙළෙඳාම හා තරගකාරිත්වය, මානව හා ආගමික වෙනස්කම්, සිවිල් කලකෝලාහල, ජනගහන සංසරණය හා වර්ධනය විසින් බිහි කර ඇති අභියෝගවලට සාර්ථක ව මුහුණ දිය හැක්කේ අනාගත දර්ශනයකින් යුතු ව අධ්‍යාපන පද්ධතිය මනාව සැලසුම් කිරීම මගිනි. (ල:10)

(04) පහත දැක්වෙන පද්‍ය පන්තිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පොපියන සිනා හිමි මිස දිනපති නමට
නොපිපේ නෙලුම් ගිනි දැල්ලක උණුසුමට
එන පොඩි පුතා-පොඩි දියණිය විදු බිමට
ලක්වෙනු දකිනු රිසියෙමු නිසි දරු පෙමට

පාරේ යනෙන විට මල් පෙරහැර වැනිය
ඉස්කෝලේ ආ විට බිඟු කැල වැනිය
හෙට ලොව උරුම මේ සේනක බල ඇණිය
අයදිති සෙනෙහසින් විදු සිප් රස පැණිය

උකුලට වැදෙති මව් තුරුලට පනින ලෙසින්
රිදුනොත් ටිකක් - දිය වැල් මතු කරයි ඇසින්
ඔවුනගේ ලොවේ දෙවියන්ට ද ඉහළ උසින්
ඔබ වෙති සිටින්නෝ පුද ලැබ සියලු දෙසින්

ගුරු කම කියන්නේ දරු දුක වැටහීම
මිනිසුන් වෙන්න මිනිසත්කම පැවරීම
නැතිනම් අබයදානය දීමක් වීම
එළඹුණු දසකයේ අප සතු වගකීම

i. මෙම පද්‍ය පන්තියේ 'ඔබ' ලෙසින් දක්වා ඇත්තේ කවුරු ද?
ii. ඔහු සතු වගකීම් ලෙස කවියා දක්වා ඇති කරුණු 2ක් ලියන්න.
iii. 'රිදුනොත් ටිකක් - දිය වැල් මතු කරති ඇසින් ' යන යෙදුමෙහි අදහස කෙටියෙන් දක්වන්න.
iv. මෙහි සඳහන් උපමාවක් හා රූපකයක් සඳහන් කරන්න.
v. පහත පදවලට සමානාර්ථ දෙන පද පද්‍යයෙන් තෝරා ලියන්න.
(අ) පංකජ (ආ) සකල (ල:10)

(05) හීන්පන්විල 'දිරිය' යෞවන සමාජය මගින් ප්‍රදේශයේ කාන්තා අභිවෘද්ධිය අරමුණ කොට ගත් පන් ආශ්‍රිත නිෂ්පාදන හඳුන්වා දීමේ වැඩ සටහනක් පැවැත්වීමට කටයුතු යොදා ඇත. මේ සඳහා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ පුහුණු ශිල්පීන්ගේ මග පෙන්වීම යොදා ගැනීමට බලාපොරොත්තු වේ. දේශීය පන් වගාවට නම් දරා ඇති මෙම ප්‍රදේශයේ මේ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීමට වඩා පහසුවක් වන අතර එමගින් අමතර ආදායමක් උපයා ගැනීමට හැකි වනු ඇත. මෙම වැඩ මුළුව 2018.07.20 වන දින පෙ.ව. 9.00 සිට ප.ව. 5.00 දක්වා හීන්පන්විල ප්‍රජා ශාලාවේ දී පැවැත්වීමට නියමිත ය. මේ පිළිබඳ ව ප්‍රදේශයේ ජනතාව දැනුවත් කිරීමට දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න.

මේ සඳහා වචන 100 ක් පමණ යොදා ගැනීම ප්‍රමාණවත් ය.

\- නැතහොත් -

ඔබ වාරියලන්ද දකුණ ග්‍රාම නිලධාරී යයි සිතන්න. පසුගිය දින ගණනක් මුළුල්ලේ ඇද හැළුණු ධාරානිපාත වර්ෂාවෙන් මානිකන්ද ඔය පිටාර ගැලීම නිසා පොදු ජන ජීවිතයට විශාල වශයෙන් හානි පැමිණ ඇත. වාසස්ථාන, පානීය ජලය, ආහාර ද්‍රව්‍ය, ඇඳුම් වැනි මූලික අවශ්‍යතාවන් සඳහා ගැටලු සහගත තත්ත්වයක් උද්ගත ව ඇත. මෙය මග හරවා ගැනීමට සහයෝගය පතමින් හොරොව්පතාන ප්‍රාදේශීය ලේකම්තුමා වෙත යවන රාජකාරී ලිපිය ලියන්න.

(ල:15)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

දෙවන වාර ඇගයීම - 2018
,உணஷலஹகஷ ஜட இண கஜபகஷகப்ல் - 2018
Second Term Evaluation - 2018

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 11 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper III | පැය / மணித்தியாலம் / Hours 02 |

නම
நகஅஉஷ ------------------------------------------------------------
Name

සැලකිය යුතුයි

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.
- **1, 2, 3, 4** ප්‍රශ්නවලටත් **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකටත්** උත්තර සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු ගණන **80** කි.

(01) (i) සිට (x) තෙක් ඇති සියලු ම ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න. කිසියම් **අනුකොටසකට ඔබ උත්තර නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) ''අපට ජයපානය බී ගත නුදුන්හ'යි'' කිපියෝ ය.

(අ) මෙසේ කිපීමට ලක් වූයේ කවුරුන් ද?

(ආ) මෙම පාඨය ඇතුළත් කතාවෙහි කතා නායකයාගේ සතුරා ලෙස සැලකෙන පුද්ගලයා වර්තමාන කතාවෙහි සඳහන් වන්නේ කුමන නමකින් ද?

(ii) ''අවුත් බෝසත්හු දිනවන ලෙස''

(අ) මෙම පද්‍ය පාදය ඇතුළත් ග්‍රන්ථය රචනා කළ කතුවරයාගේ නම ලියන්න.

(ආ) බෝසතුන් දිනවීම පිණිස පැමිණියේ කවුරුන් ද?

(iii) ''රාළහාමි ඇත්තට ම මේ ගැන මුකුත් ආරංචියක් දන්නවා ද?''

(අ) මෙම ප්‍රකාශය කවුරුන් විසින් කියන ලද්දක් ද?

(ආ) ''මේ ගැන'' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(iv) (අ) ''ලංකා මාතා'' කාව්‍ය සංග්‍රහයේ කතුවරයාගේ නම ලියන්න.

(ආ) එම කතුවරයා කිනම් ජාතිකයෙක් ද?

(v) (අ) ''සිංහබාහු ''වේදිකා නාට්‍යයට පාදක කර ගත් ජන ප්‍රවාදයේ සඳහන් වන මූලාශ්‍රය කුමක් ද?

(ආ) එම නාට්‍ය අයත් වන නාට්‍ය සම්ප්‍රදාය කුමක් ද?

(vi) ''ඇය විඳුනා දුක් මට නුරුස්සී''

(අ) මෙය කවුරුන් විසින් කරන ලද ප්‍රකාශයක් ද ?

(ආ) මෙහි ''ඇය'' යනුවෙන් හැඳින්වූයේ කවුරුන් ද?

(vii) (අ) සැළලිහිණි සන්දේශය රචනා වූ යුගය කුමක් ද?

(ආ) මෙහි කතුවරයා විසින් රචිත වෙනත් ග්‍රන්ථයක් ලියන්න.

(viii) ''මහණෙනි, මපුතුන් වැන්නවුන්ට භයෙක් කොයින් ද?

(අ) මෙය කා විසින් කරනු ලැබූ ප්‍රකාශයක් ද?

(ආ) ''මපුතුන්'' යනුවෙන් හඳුන්වනු ලැබුවේ කවුරුන් ද?

(ix) ''නොයෙක් තැන ම පිපි මල් පිරුණු පොකුණු ය''

(අ) මෙම පද්‍ය පාදය සඳහන් කෘතියේ නම ලියන්න.

(ආ) එම කෘතිය රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?

(x) ''හිරි මල් සිනා රැළි පෙණ පිඩු මිහිරිතම ''

(අ) මෙම පද්‍ය පාදය ඇතුළත් පැදි පෙළෙහි රචකයා අයත් වූ සාහිත්‍ය යුගය නම් කරන්න.

(ආ) පැදි පෙළ රචනා වූ දෘෂ්ටිකෝණය කුමක් ද?

(ලකුණු 02×10 = 20)

(02) පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) දිමුතු යසස් වන් **කුසුම සරාගේ**

**නුමුතු** සුවඳ මල් පැලඳ සරාගේ

දකුතු රඟන සුරඟන රඟ ලාගේ

------------------------------------------------------

(අ) අංකිත පදවල තේරුම් ලියන්න.

(ආ) මෙහි ඉතිරි පද්‍ය පාදය ලියන්න.

(ii) සේ රිවි බිම්බා පතළ තෙද බලැති මහරූ
මෙන රන් ටැම්බා නිසසල ගුණයෙන් සපිරූ

- මෙහි සඳහන් උපමා දෙක උපමේය සමග ලියන්න.

(අ) උපමාව ---------------------------------------- උපමේය ---------------------------------------------

(ආ) උපමාව ---------------------------------------- උපමේය ---------------------------------------------

(iii) අග පිපි මල් මලිගිය ලිය කැලේයා
**වගබැඳ** ගෙන රජ හස පුල් විලේයා
ළඟ තුරු මල් ගිලිහුණු රොනවුලේයා
මග බැස යව පළ **හෙළ වැලි** තෙලේයා

(අ) අංකිත පදවල අර්ථ දක්වන්න.

(ආ) මෙම කවියෙහි පරිසර සුන්දරත්වය ප්‍රකාශ වන කරුණු දෙකක් ලියන්න.

(iv) හුණ දඬු අගින් අහසට නැඟී ලා **තුදුස් විටක්** විචර අහස **සිසෑරි පියා** බැස ලා හුණදඬු අග සිටියහ.

(අ) අංකිත පදවල අර්ථ දක්වන්න.

(ආ) උග්ගසේනයන් මෙම කරණම ගැසීමට ප්‍රථම සිතූ සිතිවිල්ල කුමක් ද?

(v) එතෙකුදු හොත් මම් මෙ මහණෙහු **පියෙව් ගමනින්** යන්නහු **බැළ පමණින්** දිවෙනුයෙම් හඹා නොගත හෙමි.

(අ) අංකිත පදවල අර්ථ දක්වන්න.

(ආ) මෙම පාඨය ඇතුළත් අවස්ථාව කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04×05 = 20)

(03) සතර කන් මන්ත්‍රණයෙහි එන මහෞෂධ පණ්ඩිතයන්ගේ චරිතයෙන්

i අන්‍යයන් අවනත කර ගැනීමේ නුවණ

ii මානව හිතවාදි ගුණය මගින්

බෝසත් චරිතයෙහි උතුම් ගුණාංග ප්‍රකට කරන අයුරු එක් කරුණකට උදාහරණ දෙක බැගින් ගෙන විමසන්න.

(ලකුණු 15)

**නැතහොත්**

හංස සන්දේශ කතුවරයා,

(i) කැරගල විහාර බිමෙහි ඇති සදහම් පරිසරයත්,

(ii) ගමෙහි සශ්‍රිකත්වයත්

වර්ණනයට හසු කර ගැනීමෙන් ''කැරගල වෙහෙර වැනුම'' වඩාත් අර්ථවත් වී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් ගෙන විමසීමට ලක් කරන්න.

(ලකුණු 15)

(04) බැද්දේගම හා එහි වැසියන් අභාවයට යන ආකාරය පිළිබඳ ව පාඨක මනසෙහි වාග් චිත්‍ර මැවීමට එහි යොදා ගත්,

(i) උපමාලංකාර හා

(ii) ගැමි බස් වහර

යන කාව්‍යෝපක්‍රම කොතෙක් දුරට උචිත වී දැයි එක් කරුණකට උදාහරණ දෙක බැගින් ගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 15)

**නැතහොත්**

කුරක්කන් වගා කිරීමේ සිට අස්වනු නෙළා ගැනීම තෙක් ගොවියා විඳි

(i) දුක් ගැහැට හා

(ii) අභියෝග

පිළිබඳ ව ''කුරහන් ඉසිමුව කළුවර බලාලා'' පද්‍ය පන්තියෙන් නිරූපණය වන අයුරු එක් කරුණකට උදාහරණ දෙක බැගින් ගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 15)

(05) සැළලිහිණි සන්දේශයෙන් ආගමික හා දේශපාලන ආදීකාලීන සමාජ තොරතුරු ඉදිරිපත් කෙරෙන අයුරු නියමිත පද්‍ය පන්තිය අසුරෙන් උදාහරණ තුනක්වත් සහිත ව විස්තර කරන්න.

(ලකුණු 10)

(06) ''අඟුල්මල් දමනයෙහි අවස්ථා නිරූපණය කතුවරයාගේ ගේ ප්‍රතිභාව විදහා දක්වන කැඩපතක් වැන්න'' උදාහරණ තුනක්වත් මගින් මෙම කියමන සනාථ කරන්න.

(ලකුණු 10)

(07) ''මුනි සිරිපා සිඹිමින්නේ'' පද්‍ය පන්තියෙහි යොදා ගත් කාව්‍යෝපක්‍රම එහි අරමුණ සාක්ෂාත් කර ගැනීමට වඩාත් උචිත වූ ආකාරය නිදසුන් තුනක්වත් මගින් පෙන්වා දෙන්න.

(ලකුණු 10)